# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1108/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 05/07/2024
පැය 2045

## මාධ්‍ය නිවේදනය

## ජාත්‍යන්තර පොලිස් සංගමයේ මෙරට ශාඛාවට වසර 50ක් සපිරීම නිමිත්තෙන් සංගමයේ සාමාජික නිලධරයන්ට සම්මන්ත්‍රණයක්.

ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර පොලිස් සංගමයේ සාමාජිකත්වය හිමිවී වර්ෂ 50 ක් සපිරීම නිමිත්තෙන් ජාත්‍යන්තර පොලිස් සංගමයේ මෙරට ශාඛාව විසින් පවත්වන වැඩසටහන් පෙළේ එක් වැඩසටහනක් ලෙස එහි සාමාජික ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ එක් දින සම්මන්ත්‍රණය **2024.07.05 වන අද දින කොළඹ 07, ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ජාත්‍යන්තර පොලිස් සංගමයේ මෙරට සභාපති පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් එම සංගමයේ මෙරට උප සභාපති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතාගේ සහභාගීත්වයෙන්, සංගමයේ මෙරට මහ ලේකම් ලෙස කටයුතු කරනු ලබන කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක සුනේත්‍රා සෙනෙවිරත්න මහත්මියගේ මෙහෙයවීම මත සාර්ථකව පැවැත්විය.**

මෙම එක්දින සම්මන්ත්‍රණය සඳහා පොලිස් නිලධාරීන් 100 කට ආසන්න පිරිසක් සහභාගී වූ අතර එහිදී අපරාධ විමර්ශනයේදී පොලිසියේ කාර්යභාරය තේමා කරගනිමින් පවත්වන ලද අතර එහිදී ලිංගික අපරාධ සහ වංචා විමර්ශනයේදී අපරාධ විමර්ශකයෙකුගේ කාර්යභාරය, අපරාධ විමර්ශනයේදී හා අපරාධ විශ්ලේෂණයේදී සංඛ්‍යා ලේඛන වල වැදගත්කම යන විෂයන්හි දැනුම පැමිණි ප්‍රවීන දේශකයින් වන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජේ.ඒ චන්ද්‍රසේන, ප්‍රධාන පොලිස් පරීක්ෂක සී.එම් ප්‍රේමකුමාර, අපරාධ විද්‍යාඥ චමින්ද මිල්ලවිතානච්චි යන මහත්වරුන් විසින් සාරගර්භ දේශන මඟින් රැස්ව සිටි පොලිස් නිලධරයන් වෙත ලබාදුන් අතර වැඩමුළුව සඳහා සහභාගී වූ සියළුම නිලධාරීන් වෙත වටිනා සහතිකපතක් පිරිනමන ලදි.

උත්සව අවස්ථාවට අදාල ඡායාරූප












SPECIAL TASK FORCE













**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**